(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(14).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 නොවැම්බර් 25 සෙනසුරාදා**

**2023 දෙසැම්බර් 04 සඳුදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා,— සංචාරක කටයුතු පනත යටතේ නියමය,— 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 26(1) වගන්තිය යටතේ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ නිර්දේශය මත, සංචාරක සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සම්බන්ධයෙන් සංචාරක හා ඉඩම් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 26 දිනැති අංක 2342/26 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.11.14 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

*

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— උක් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2019),— 1981 අංක 75 දරන උක් පර්යේෂණ ආයතන පනතේ 19 වන වගන්තිය යටතේ 2023.02.09 දින ඉදිරිපත් කරන ලද 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් උක් පර්යේෂණ ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පොල් පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ 44 වගන්තිය යටතේ 2023.02.10 දින ඉදිරිපත් කරන ලද 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් පර්යේෂණ ආයතනයේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ වාර්ෂික වාර්තාව (2019),— 1993 අංක 52 දරන තේ පර්යේෂණ මණ්ඩල පනතේ 16 වන වගන්තිය යටතේ 2023.02.22 දින ඉදිරිපත් කරන ලද, 2019.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් තලවාකැලේ ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ 2019 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— පොල් සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2020),— 1971 අංක 46 දරන පොල් සංවර්ධන පනතේ III වන කොටසේ 24 වගන්තිය යටතේ 2023.03.08 දින ඉදිරිපත් කරන ලද, 2020.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් පොල් සංවර්ධන අධිකාරියේ 2020 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව (2021),— 1975 අංක 35 දරන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ 2023.03.23 දින ඉදිරිපත් කරන ලද, 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙල කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(වැවිලි කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව විසින් 2023.06.08 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2023.07.05 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

*

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 137 ප්‍රකාරව දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා වන මතු දැක්වෙන සංශෝධනය පිළිගත යුතුය:—

**දැනට පවත්නා පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 113ට ඉක්බිතිවම මතු සඳහන් නව ස්ථාවර නියෝගය 113 අ වශයෙන්, ඇතුළත් කිරීම:—**

**113 අ නව ස්ථාවර නියෝගය,—**

**පශ්චාත් ව්‍යවස්ථාදායක විමර්ශන කාරක සභාව**

113 අ (1) තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන සාමාජික මන්ත්‍රීවරයන් විසි එක් දෙනෙකුගෙන් සමන්විත "පශ්චාත් ව්‍යවස්ථාදායක විමර්ශන කාරක සභාව" යනුවෙන් හඳුන්වනු ලබන කාරක සභාවක් තිබිය යුත්තේ ය.

(2) ජනතාවගේ අපේක්ෂාවන් සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය ප්‍රතිසංස්කරණ සිදුකිරීම කිරීම සඳහා, පවතින නීති පරීක්ෂා කිරීම සහ පාර්ලිමේන්තුවට අවශ්‍ය සංශෝධන යෝජනා කිරීම පශ්චාත් ව්‍යවස්ථාදායක විමර්ශන කාරක සභාවේ කාර්යය විය යුත්තේ ය.

(3) කලින් කලට අවශ්‍ය ව්‍යවස්ථාදායක ප්‍රතිසංස්කරණ පිළිබඳව සොයා බැලීම සඳහා, අවශ්‍ය නම්, විශේෂඥයන්ගේ සහාය ඇතිව පර්යේෂණයන්හි නිරත වීමට පශ්චාත් ව්‍යවස්ථාදායක විමර්ශන කාරක සභාවට බලය ඇත්තේ ය.

(4) එකී අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා, පශ්චාත් ව්‍යවස්ථාදායක විමර්ශන කාරක සභාව විසින් සෑම මාස හයකට (06)ට වරක්ම තමන් විසින් ඉටු කරන ලද කාර්යයන් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කරනු ලැබිය යුත්තේ ය.

පා.81/2023

ගරු දයාසිරි ජයසේකර මහතා

ගරු විමල් වීරවංශ මහතා

ගරු උදය ගම්මන්පිල මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු (ආචාර්ය) නාලක ගොඩහේවා මහතා

ගරු සාරතී දුෂ්මන්ත මහතා

ගරු ජයන්ත සමරවීර මහතා

ගරු පියංකර ජයරත්න මහතා,— වර්තමානයේ ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් ඇති වී තිබෙන ගැටලු පිළිබඳව සොයා බලා සුදුසු නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා වන පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව,— වර්තමානයේ ක්‍රිකට් ක්‍රීඩාව සම්බන්ධයෙන් උද්ගතව ඇති ගැටලු ප්‍රමාණය ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාවට ආදරය කරන සියලු දෙනාගේ කතා බහට හා අවධානයට ලක් වී තිබෙන හෙයින්;

2023 ලෝක කුසලාන ක්‍රිකට් තරඟාවලියට සුදුසුකම් ලබාගැනීම වෙනුවෙන් පැවැති තරඟාවලියේ දී සියලු තරඟ ජයග්‍රහණය කළ ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම පසුගිය ලෝක කුසලාන තරඟාවලියේ පරාජයට පත්වීමේ හේතු කවරේද යන්න සොයා බැලීමටත්, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා හා විපක්ෂ නායකවරයා ඇතුළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් එල්ල කරන ලද දූෂණ චෝදනා පිළිබඳව සොයා බැලීමටත්, ක්‍රීඩා විෂය භාර අමාත්‍යවරයා හා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අතර ඇති වී තිබෙන ගැටුම පාදක කොටගෙන ජාත්‍යන්තර ක්‍රිකට් කවුන්සිලය (International Cricket Council) විසින් ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව තහනමකට ලක් කිරීම පිළිබඳව හා ඒ සඳහා පාර්ලිමේන්තුව විසින් ගත හැකි ක්‍රියාමාර්ග කවරේද යන්න සොයා බැලීමටත්, ශ්‍රී ලංකාවේ ක්‍රිකට් ක්‍රීඩාව හා පාසල් ක්‍රිකට් ක්‍රීඩාව නංවාලීම සඳහා ගත යුතු පියවර නිර්දේශ කිරීම සඳහාත් පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කර සිටියි.

2. (අ) කථානායකවරයා විසින් කාරක සභාවෙහි සභාපතිවරයා සහ සාමාජික මන්ත්‍රීවරයන් පත්කළ යුතුය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101හි විධිවිධාන ප්‍රකාරව කාරක සභාව සාමාජික මන්ත්‍රීවරයන් දස දෙනෙකුගෙන් (10) සමන්විත විය යුතුය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම තැනැත්තෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම තැනැත්තෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිතව හෝ වාචිකව, ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවේ සහාය පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඇ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද පාර්ලිමේන්තුව කල් තබනු ලැබ හෝ වාරාවසාන කරනු ලැබ තිබුණ ද රැස්වීම් පවත්වාගෙන යාමට ද

බලය තිබිය යුතු ය.

4. කාරක සභාවේ වාර්තාව එහි පළමු රැස්වීමේ සිට මාස දෙකක (02) කාලයක් හෝ පාර්ලිමේන්තුව විසින් දීර්ඝ කරනු ලබන එවැනි කාල පරිච්ඡේදයක් ඇතුළතදී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***